# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2157/44 - 2020 ජනවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා. අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/14/9

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති**

**ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

1. ගරු උපාලි අබේරත්න මැතිතුමා
   විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු දයා චන්ද්‍රසිරි ජයතිලක මැතිතුමා
   විශ්‍රාමික අභියාචනාධිකරණ විනිශ්චයකාර
3. චන්ද්‍රා ප්‍රනාන්දු මැතිතුමා
   විශ්‍රාමික පොලිස්පති

වෙත,
සුභාශිංසන පූර්වකවයි!

රජය වෙනස් වීමත් සමඟ රජයේ නිලයෙන් ඉල්ලා අස් වූ හෝ අන්‍යාකාරයෙන් රජයේ නිලය දැරීම අවසන් වූ එසේ නැතහොත් එබඳු රජය වෙනස් වීමෙන් අනතුරුව ද එම නිලය තව දුරටත් දැරුවා වූත් පිළිවෙලින් 2015 ජනවාරි මාසයේ දී සහ අගෝස්තු මාසයේ දී පැවති ජනාධිපතිවරණයට සහ/හෝ මහ මැතිවරණයට පෙර නිල තල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි මෙන්ම පොලිස් සේවයෙහි සාමාජිකයින් 2015 ජනවාරි මස 08 වන දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16 දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ දී දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කරනු ලැබූ බැව් වාර්තා කරනු ලැබ ඇති හෙයින් ද,


1A - G 31485 — 387 (2020/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තව ද, එබඳු දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීමේ ක්‍රියාවලිය එකී සිදු වුණායි කියනු ලබන දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීමේ කාල සීමාව තුළ අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතේ ක්‍රියාත්මක දූෂණ විරෝධී කටයුතු පිළිබඳ ව ක්‍රියා කරන විශේෂ ඒකකයක් හරහා මෙහෙයවනු ලැබූ බැව්, සිදු වුණායි කියන දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීම ඉදිරියට කරගෙන යාමෙහි ලා හසුරවනු ලැබූ ආයතනයන්හි නිලතල දැරූ නැතහොත් තව දුරටත් නිලතල දරන්නාවූ රජයේ නිලධරයන් ඇතුළු යම් තැනැත්තන් ගණනාවක් විසින් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනු ලැබ ඇතැයි වාර්තා කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, පූර්වෝක්ත කාල සීමාව තුළදී විමර්ශනයට භාජනය කරනු ලැබිය යුත්තේ කවර තැනැත්තෙකු ද යන වග එකී දූෂණ විරෝධී ඒකකය විසින් පළමුව තීරණය කොට අනතුරුව පැමිණිලි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය සහ/හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය වෙත යොමු කරනු ලැබූ බවට චෝදනා කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය සහ/හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය හමුවේ මහජනයා විසින් කරනු ලැබූ පැමිණිලි ගණනාවක් නොසලකා හරිනු ලැබ ඇති බවට චෝදනා කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, සිදු විණායි කියනු ලබන දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීමේ ක්‍රියාවලිය මඟින් රජයේ නිලධරයන්ගේ, රාජ්‍ය සංස්ථාවන්හි සේවා නියුක්තිකයින්ගේ, සන්නද්ධ හමුදා සහ පොලිස් සේවයේ සාමාජිකයින්ගේ කාර්ය සාධනය කෙරෙහි සැලකිය යුතු ඍණාත්මක බලපෑමක් ඇති කරනු ලැබ ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ස්වකීය රාජකාරි ඉටු කරලීමේ දී තීරණ ගැනීමට එකී නිලධරයන්, සේවා නියුක්තිකයින් සහ සාමාජිකයින් අකැමැත්තක් දක්වා ඇති අතර එලෙසින් අකැමැත්තක් දක්වමින් ස්වකීය වැඩ කටයුතු කෙරෙහි නිශ්ක්‍රීය ප්‍රවේශයකින් ක්‍රියා කිරීමට වැඩි කැමැත්තක් දැක්වීම හේතුවෙන් රජයේ කාර්යයන් කෙරෙහි අහිතකර බලපෑමක් සිදුවෙමින් ඇති බැව් මගේ දැන ගැනීමට යොමු කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, මේ අධිකාරී පත්‍රයෙහි මින් මතු සඳහන් කරනු ලබන කරුණු, සිදු විණායි කියන දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීම සම්බන්ධ හෝ ඒ පිළිබඳව වගකිව යුතු කිසියම් තැනැත්තෙකු, තැනැත්තන් හෝ අස්ථිත්වයන් (Entities) වෙතොත් හඳුනාගැනීම ඇතුළුව රාජ්‍ය ආයතනයන් හි පරිපාලනය, නීතිය සහ/හෝ යුක්තිය පසිඳලීම, රජයේ නිලධරයන්ගේ පැවැත්මට අදාළ වන කාරණා සහ/හෝ මගේ මතය අනුව පොදු යහපත උදෙසා පරීක්ෂණයක් පවත්වනු ලබන්නා වූ කාරණා වන බැවින් ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා තොරතුරු ලබාගැනීම අවශ්‍ය යැයි මට පෙනී යන හෙයින් ද,

තවද, එබඳු පරීක්ෂණයකින් පැන නගින කරුණු අනාවරණය කරගැනීම, වාර්තාව සහ නිර්දේශයන්, නිවාරණ හා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි වැඩදායී මෙන්ම පහසුකරවනු ඇති හෙයින් ද,

තවද, මේ අධිකාරී පත්‍රය යටතේ පූර්වෝක්ත කාරණය පිළිබඳව පවත්වනු ලබන පරීක්ෂණයෙහි විෂය සීමාව මඟින් ස්වකීය ව්‍යවස්ථාපිත සහ නෛතික වගකීම් ක්‍රියාත්මක කරන්නා වූ අදාළ බලධාරීන් කෙරෙහි කවරාකාරයකින් වුව ද අවහිරයන් නොපැනවෙන බැව් සනිටුහන් කරන අතරම, මේ අධිකාරී පත්‍රය ප්‍රකාරව පවත්වනු ලබන පරීක්ෂණය නොතකා අදාළ කළ හැකි ලිඛිත නීති ප්‍රකාර, ගත හැකි පියවර සලකා බැලීමට සහ හැකි අවස්ථාවන්හිදී එලෙසින් පියවර ගැනීමට අදාළ කළ හැකි ලිඛිත නීති ප්‍රකාර අදාළ බලධාරීන්ට බලය පවරනු ලබන බව ද සනිටුහන් කෙරෙන හෙයින් ද,

තවද, මේ අධිකාරී පත්‍රය යටතේ කරනු ලබන පරීක්ෂණය වූ කලී ශ්‍රී ලංකා පොලීසිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ නීතිපතිවරයා ඇතුළු අදාළ බලධාරීන් විසින් ගනු ලැබ ඇති හෝ ගනු ලැබිය හැකි කිසියම් ක්‍රියා මාර්ගයන්ට අමතර වශයෙන් සහ අගතියකින් තොරව වන බැව් සනිටුහන් කරනු ලබන හෙයින් ද,

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම වර්ෂ 2015 ජනවාරි මස 08 වන දිනෙන් ආරම්භව 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වන කාල සීමාව තුළ සිදු විණායි කියනු ලබන දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීම සහ විශේෂයෙන්ම මතු දැක්වෙන කාරණා පිළිබඳව පරීක්ෂා කොට තොරතුරු ලබාගනු පිණිස සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය වන) 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තියෙන් සහ විශ්වාසයෙන් යුතුව ඉහත කී,

1. ගරු උපාලි අබේරත්න මැතිතුමා
   විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු දයා චන්ද්‍රසිරි ජයතිලක මැතිතුමා
   විශ්‍රාමික අභියාචනාධිකරණ විනිශ්චයකාර
3. චන්ද්‍රා ප්‍රනාන්දු මැතිතුමා
   විශ්‍රාමික පොලිස්පති

මගේ කොමසාරිස්වරුන් ලෙස මෙමගින් පත් කරමි.

එකී කරුණු කවරේ ද යත්,

(අ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය පරිපාලනය සම්බන්ධයෙන් යම් අයථා ක්‍රියා හෝ අක්‍රමිකතා නැතහොත් ඊට අදාළ වන නිසි පිළිවෙත්, ප්‍රතිමාන, මාර්ගෝපදේශ, කාර්ය පටිපාටීන් සහ ප්‍රශස්ථ පරිචයන් නොසලකා හැරීමක් සිදු වී තිබේ ද යන වග;

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය විසින් කෙරුණු කිසියම් විමර්ශනයන් කෙරෙහි කවර වූ ආකාරයකින් බලපෑම් කිරීමක්, අවහිර කිරීමක් හෝ වළක්වාලීමක් සිදු කිරීම හේතු කොටගෙන කිසියම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඍජුව හෝ ව්‍යංගයෙන් හානියක්, අලාභයක්, පීඩාවක් හෝ අනර්ථයක් සිදුව තිබේ ද යන වග;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය විසින් විමර්ශනයන් පැවැත්වීමේ කාර්යය පවරනු ලැබූ කිසියම් නිලධරයෙක් ඉහත කී දූෂණ විරෝධී ඒකකය ඇතුළු තෙවන පාර්ශවයන් විසින් කෙරුණු අයුතු බලපෑම යටතේ ක්‍රියාකර තියේ ද යන වග;

(ඈ) ඉහත කී දූෂණ විරෝධී ඒකකය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකයෙහි කාර්යයන්ට අදාළව නැතහොත් කිසියම් නීතියක් පසිඳලීම හෝ යුක්තිය පසිඳලීමට අදාළව කිසියම් තැනැත්තෙක් දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීමේ දී බලය අනිසි ලෙස යෙදවීමක්, අවභාවිත කිරීමක්, දූෂණ හෝ කිසියම් වංචනික ක්‍රියාවක් සිදු කර තිබේ ද යන වග;

සහ මේ අධිකාරී පත්‍රය ප්‍රකාර පරීක්ෂණයට භාජනය කරනු ලැබූ ඕනෑම කරුණක් / කරුණු පිළිබඳව නිර්දේශයන් කිරීම තවද, ගරු උපාලි අබේරත්න මැතිතුමා කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස මම මෙයින් පත් කරමි.

තවද, පූර්වෝක්ත කරුණු පිළිබඳව ඔබහට පෙනී යන පරිදි අවශ්‍ය විය හැකි පරීක්ෂණ සහ සියලුම විමර්ශන පැවැත්වීමට ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබ හට මෙයින් අධි බලය ලබා දෙමින් බලය පවරන අතර ඔබගේ පරීක්ෂණයන්ගෙන් අනාවරණය වන කරුණු සහ ඔබගේ නිර්දේශ ගෙනහැර දක්වමින් ඔබගේ අත්සනින් යුතුව වාර්තා හෝ අතුරු වාර්තා මේ අධි පත්‍රයෙහි දින සිට මාස හයක් (06) ඇතුළත මවෙත ඉදිරිපත් කරන ලෙස මම ඔබ හට නියම කරමි.

තවද, ඔබගේ අභිමතය පරිදි නිශ්චය කෙරෙන පූර්වෝක්ත කාරණා වලට අදාළ වන යම් පරීක්ෂණයක කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්වීම මැනවයි මම මෙයින් විධානය කරමි.

තවද, ඔබගේ පරීක්ෂණ සහ විමර්ශන පිළිබඳ කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ලබා ගනු පිණිස ඉල්ලුම් කර සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් සහ සෙසු තැනැත්තන් විසින් මෙහි ලා නිසි පරිදි සැපයිය හැකි එබඳු සියලුම සහාය සහ සියලුම තොරතුරු ලබා දිය යුතු යැයි මම මෙයින් නියම කොට විධානය කරමි.

පූර්වෝක්ත පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියෙහි විධිවිධාන, මේ කොමිෂන් සභාවට අදාළ විය යුතු බව මෙමම මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ 2020 ක් වූ ජනවාරි මස 09 වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

පී.බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.